මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சு

Ministry of Public Security and Parliamentary Affairs

2025

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2025

18 වන මහළ, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

පටුන

පිටු අංකය

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 01 - 05

1.1 හැඳින්වීම 01

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු 02 - 03

1.3 කාර්යය හා කර්තව්‍ය 04

1.4 සංවිධාන සටහන 05

1.5 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 05

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 06 - 10

03. පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශන 11 - 15

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක 16

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු 16 - 20

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 20

විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව 21 - 32

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 33 - 39

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අභ්‍යන්තර ආරක්ෂක අංශය 2020.11.20 දිනැති අංක 2202/25 අති විශේෂ ගැසට් පත්‍රය මගින් විෂය පථය සංශෝධනය කර මහජන ආරක්ෂක අමාත්‍යාංශය පිහිටුවා ඇත. එදින සිට අවස්ථා කිහිපයකදී අමාත්‍යාංශයීය විෂය පථය සංශෝධනය වූ අතර 2024.11.25 දිනැති අංක 2412/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් එවකට පැවති අමාත්‍යාංශයේ විෂය පථය සංශෝධනය කර මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය පිහිටුවනු ලැබිය. ඒ අනුව වර්තමාන රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් පවත්වා ගැනීම සඳහා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන කටයුතු කර ඇත. ඒ අනුව රට තුළ සියලුම පුරවැසියන්ට බියෙන් සැකෙන් තොරව නිදහසේ ජීවත්වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමටත්, දේශීය හා විදේශීය පුද්ගලයන් සඳහා ආගාමික හා විගාමික කාර්යයන් සඳහා පහසුකම් සැලසීමටත්, ජාතික ආර්ථිකයට ශක්තියක් වන ලෙසට රට තුළ ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධාන ජාලය නියාමනය කිරීමටත්, මත්ද්‍රව්‍ය උවදුර මැඬලීමටත් ප්‍රධාන වශයෙන් කටයුතු කරනු ලබයි.

ඒ අනුව මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයට පැවරුණු ප්‍රධාන වගකීම් වන පුරවැසියන්ට බියෙන් සැකෙන් තොරව ජීවත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම, පුරවැසි අනන්‍යතාවය, දේශීයව හා විදේශීයව සහතික කිරීම, මත්ද්‍රව්‍ය උවදුර හා අන්තරායකර ඖෂධ දුර්භාවිතය මැඩපැවැත්වීම සහ රට තුළ ක්‍රියාත්මක ජාත්‍යන්තර හා දේශීය රාජ්‍ය නොවන සංවිධාන රාජ්‍ය ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක කරවීම තුළින් නීති ගරුක පුරවැසියන්ගෙන් යුත් සමාජයක් ස්ථාපිත කිරීම සඳහා අමාත්‍යාංශය විසින් සම්පාදනය කර දෙනු ලබන ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන්ට අනුව සියලු ආයතන කටයුතු කරමින් සිටි.

ඒ සඳහා අවශ්‍ය සැලසුම් සකස් කරමින් හා ඒවා ක්‍රියාත්මක කරමින් අමාත්‍යාංශයේ ප්‍රධාන කර්තව්‍යයන් ඉටු කර, රටේ සංවර්ධන කාර්යයට සහාය දැක්වීමට කටයුතු කරමින් සිටියි. එසේම මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය මේ වන විට දීර්ඝ කාලයක සිට ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන්ගේ නොවිසඳී පැවති උසස්වීමේ හා පුහුණු කිරීමේ ගැටළු විසඳීමට ද ඔවුන් සඳහා තාක්ෂණික හා යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි ලබාදීමට ද සුවිශේෂී අවධානයක් යොමුකරමින් කටයුතු සම්පාදනය කරමින් සිටින අතර ඒ තුළින් මහජන හිතකාමී සේවාවක් ශ්‍රී ලංකා පොලීසිය තුළින් ගොඩනැගීමට අපේක්ෂා කරනු ලැබේ.

උක්ත කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශ විෂය පථයට අදාළව ප්‍රතිපත්ති සැකසීම, මඟපෙන්වීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, කාර්ය සාධන ඇගයීම සහ පසුවිපරම් කටයුතු සඳහා අවශ්‍ය සියලු කටයුතු අමාත්‍යාංශයේ එක් එක් අංශ විසින් ඉටුකරනු ලබයි.

1.2. දැක්ම

“සාමකාමී සුරක්ෂිත දේශයක්”

1.2. මෙහෙවර

‘‘මහජන ආරක්ෂාව සුරැකි යහපත් සමාජයක් බිහි කිරීමට හා මත්ද්‍රව්‍ය, අපරාධ හා ත්‍රස්තවාදයෙන් තොර ආගමන විගමන නියාමනයන් විධිමත් කිරීමට ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කර ක්‍රියාවට නැංවීම’’

1.2 අරමුණු

- සියලුම රටවැසියන්ගේ ආරක්ෂාව සහ අනන්‍යතාවය තහවුරු කර ජීවත්වීමට සුදුසු පරිසරයක් බිහිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා මගපෙන්වීම.

- පොලිස් සේවාවේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වැඩිදියුණු කිරීමට නවීන තාක්ෂණික උපාංග හා පුහුණුව ලබාදීම මඟින් පොලිස් නිලධාරීන්ගේ වෘත්තීයමය භාවය ඉහළනැංවීම.

- ජන ජීවිතය සුරක්ෂිතව පවත්වා ගෙන යාමට හැකිවන පරිදි අන්තවාදය, ත්‍රස්තවාදී කටයුතු, මංකොල්ලකෑම්, මිනීමැරුම්, පාතාල ක්‍රියා, මත්ද්‍රව්‍ය උවදුර විනාශ කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා පොලීසියේ බුද්ධි අංශය හා ක්‍රියාකාරී කොට්ඨාශ ශක්තිමත් කර පවත්වාගෙනයාම.

- ශ්‍රී ලංකා පොලීසියේ යටිතල පහසුකම් සංවර්ධනයට, අදාල සැලසුම් සකස්කර එහි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අධීක්ෂණ හා පසුවිපරම් ක්‍රියාවලිය ශක්තිමත්ව පවත්වාගෙනයාම.

- රථවාහන මඟින් සිදුවන අනතුරු, ආබාධිත තත්ත්වයන්, මරණ අවම කරගැනීම උදෙසා රථවාහන හැසිරවීම, පාලනය හා නියාමනයට නවීන තාක්ෂණික යෙදවුම් හා භාවිතයන් හඳුන්වාදීම.

- පුද්ගල අනන්‍යතාවය අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව දේශීයව හා විදේශීව තහවුරු කිරීමට පසුබිම සැකසීම.

- මත්ද්‍රව්‍ය උවදුර සහ අන්තරායකර ඖෂධ දුර්භාවිතය මැඩලීමට සුදුසු උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ශ්‍රී ලංකාව තුළ ක්‍රියාකාරීව පවතින සියළුම රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය ප්‍රතිපත්තීන් තුළ එකී සංවිධාන ක්‍රියාත්මක වන බව නිශ්චය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

1.3 කාර්යයන් හා කර්තව්‍යයන්

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා මහජන ආරක්ෂාව හා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ විෂයයන්ට ගැනෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

- අමාත්‍යාංශ විෂයය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.

- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණ යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.

- නීතිය හා සාමය පවත්වාගෙන යාම.

- සමාජ විනය තහවුරු කෙරෙන පුළුල් ප්‍රතිසංස්කරණ ඇතුළත් උපායමාර්ග ක්‍රියාත්මක කිරීම.

- සමාජ ව්‍යසනයක් බවට පත්ව තිබෙන විවිධ අන්දමේ අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීමට හා මැඩපැවැත්වීමට කටයුතු කිරීම.

- රථවාහන ගමනාගමනය පාලනය කිරීම.

- මහජන ආරක්ෂාව තහවුරු කිරීමත්, මහජනතාවට සමීප වන පරිදිත් පොලිස් සේවයේ සේවා මට්ටම ඉහළ නැංවීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදු කිරීම.

- ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ රාජ්‍ය නොවන සංවිධානවල කාර්යයන් සම්බන්ධීකරණය කරමින් රටේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායක වීමට අවස්ථා සැලසීම.

- ආගමන හා විගමන කටයුතු.

- අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීම හා පාලනය.

- පාර්ලිමේන්තුවට හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්යයන්ට අදාළව රජය විසින් ඉටු කළ යුතු කාර්යයන්.

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්යය මණ්ඩලවලට සම්බන්ධ ආයතනික කටයුතු.

1.4. සංවිධාන සටහන



1.5 අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය යටතේ පහත ආයතන ක්‍රියාත්මක විය.

i. ශ්‍රී ලංකා පොලීසිය
ii. විශේෂ කාර්ය බලකාය
iii. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
iv. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
v. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
vi. ජාතික පොලිස් අභ්‍යාස ආයතනය

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

- **මානව සම්පත් සංවර්ධනය ...**

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ විෂය පථය පුළුල් වීමත් සමඟ මෙම අමාත්‍යාංශයේ රාජකාරි ඉටු කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් 479 දෙනෙකුගෙන් සමන්විත කාර්යය මණ්ඩලයක් අනුමත කර ඇත. ඒ අනුව සංවර්ධන නිලධාරීන් 382 දෙනෙක් අනුමත කර ඇති අතර ඉන් සංවර්ධන නිලධාරින් 342 දෙනෙකු අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සේවය සඳහා අනුයුක්ත කර ඇත. ඒ අනුව මෙම අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලය නිලධාරීන් 137 ක් වුවද මේ වන විට අමාත්‍යාංශයේ නිලධාරීන් 98 දෙනෙකු සේවය කරනු ලබයි. එසේම 2025 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට සමස්ත කාර්යය මණ්ඩල අවශ්‍යතාවයෙන් 80% ක් සම්පූර්ණ කර ගැනීමට හැකියාව ලැබී ඇත. එමෙන්ම වැටුප් රහිත නිවාඩු ඉල්ලීම් යටතේ අමාත්‍යාංශයේ සිවිල් නිලධාරීන් 11 දෙනෙකුට දේශීය හා විදේශීය නිවාඩු ලබා දී ඇත.

- **නිලධාරීන් පුහුණු පාඨමාලාවලට සම්බන්ධ කිරීම ...**

ආයතනයක පොදු දැක්ම ළඟා කරගැනීමට හැකිවන සේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට අවශ්‍ය දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීම සඳහා අඛණ්ඩ පුහුණුවීම් ලබා දීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ අනුව අමාත්‍යාංශ නිලධාරීන්ගේ දැනුම, ආකල්ප, නිපුණතා හා ධනාත්මක චින්තනය සංවර්ධනය උදෙසා විවිධ පුහුණු වැඩසටහන්වලට සම්බන්ධ කර ඇත.

ඒ අනුව නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය උදෙසා දේශීයව පුහුණුව ලබා දෙන ආයතන සමඟ සම්බන්ධීකරණය වී භාෂා පුහුණු, තොරතුරු තාක්ෂණය සම්බන්ධ පුහුණු, විෂයානුගත පුහුණු වශයෙන් අමාත්‍යාංශයේ සියලුම තනතුරු දරන කාර්යය මණ්ඩල සාමාජිකයන් සඳහා සමාලෝචිත කාල සීමාව තුළ පුහුණු අවස්ථා ලබා දී ඇති අතර ඒ සඳහා 2025 වර්ෂයේදී රු. 987,000.00 වැය කර ඇත. ඒසේම 2025 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන විට අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් 07 දෙනෙකු විදෙස් පුහුණු හා විදෙස් සමුළු සඳහා සහභාගි වී ඇත.

- **විශේෂිත වූ කාර්යයන් විධිමත්ව ඇරඹීම උදෙසා...**

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ හා ඒ යටතේ ඇති ආයතනවල සිදුකරනු ලබන කාර්යයන් විධිමත්ව හා නෛතික රාමුවක් තුළ සිදුකිරීම සඳහා 2025 වර්ෂයේ සමාලෝචිත කාල සීමාව තුළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 70 ක් ඉදිරිපත් කර ඇත. ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයෙන් ලද අනුමැතීන් හා නිර්දේශයන් අනුව අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල කාර්යයන් විධිමත්ව ඉටු කිරීම සඳහා අවශ්‍ය පියවරයන් ගෙන ඇත.

- **ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන ක්‍රියාවට නංවමින්...**

'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' යන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඇති අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා 2025 වර්ෂය තුළ ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන ක්‍රියාත්මක කිරීමට රජය සැලසුම් කරණ ලදි. එම වැඩසටහන සමාජයීය, පාරිසරික හා සදාචාරාත්මක කුළුණු මත සැලසුම් කර ඇති අතර එම වැඩසටහන මඟින් මෙතෙක් කාලයක් රට තුළ සංවර්ධනය කිරීම සඳහා අවධානය යොමු නොවූ ක්ෂේත්‍ර රාශියක් ඔස්සේ කටයුතු කිරීමට අවස්ථාව උදාවීය.

ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන හරයාත්මක ලෙස ක්‍රියාත්මක කිරීම පිණිස රජය මඟින් විවිධ වූ ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය වෙත පැවරුණු කාර්යයන් ඉටුකිරීම සඳහා රුපියල් මිලියන 300 ක ප්‍රතිපාදන ලබා දෙන ලදි.

2025 වර්ෂයේ Clean Sri Lanka වැඩසටහන යටතේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය වෙත ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර එම ප්‍රතිපාදනයන් යොදා ගනිමින් ශ්‍රී ලංකා පොලිසිය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් සැලසුම් කරන ලද ව්‍යාපෘති ක්‍රියාවට නැවීමට කටයුතු කරණ ලදි.

- **අය වැය යෝජනා 2025 ක්‍රියාත්මක කරමින්….**

තරුණ කොටස් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම, සමාජයේ විශාල ගැටළුවක් බවට පත් වී ඇත. එම තත්ත්වය පාලනය කර ගැනීම සඳහා දඬුවම් කිරීමෙන් ඔබ්බට ගිය බහුවිධ ක්‍රමවේදයන් අනුගමනය කිරීමටත්, එමඟින් මත්ද්‍රව්‍යවලින් තොර සමාජයක් බිහි කිරීමටත් ඇති හැකියාව පිළිබඳව රජය හඳුනාගෙන ඇත. ඒ සඳහා අවශ්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2025 වර්ෂයේ අයවැය යෝජනාවක් ලෙස මෙම අමාත්‍යාංශයට රු. මි. 500 ප්‍රතිපාදනයක් ලබාදෙන ලදි.

ඒ අනුව, මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, උපදේශනය ඇතුළු පුනරුත්ථාපන කටයුතු, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සවිබල ගැන්වීම සහ සමාජගත කිරීම සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට රුපියල් මිලියන 250ක මුදලක් ලබා දී තිබූ අතර එමඟින් ව්‍යාපෘති 10ක් ක්‍රියාත්මක කරණ ලදි. එසේම ශ්‍රී ලංකා පොලීසියට මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 250ක ප්‍රතිපාදන වෙන් කරදී තිබූ අතර එමඟින් ව්‍යාපෘති 12ක් ක්‍රියාත්මක කරණ ලදි.

මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය, පසු විපරම් කිරීම හා නිවැරදි ක්‍රමවේදයන් ඔස්සේ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබාදීම මෙම අමාත්‍යාංශය මඟින් සිදුකරන ලදි. එසේම මෙම ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචන කටයුතු මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් රාජ්‍ය ආයෝජන හා ඇගයීම් කමිටුව විසින් ද සිදු කරන ලදි.

- **පොලිස් ස්ථානවල ස්ථාපිත කර ඇති ළමා හා කාන්තා කාර්යාංශවල භෞතික පහසුකම් හා පොදු පහසුකම් වැඩි දියුණු කිරීම…**

එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ දායකත්වයෙන් ළමා හා කාන්තා කාර්යාංශ භාරයට ගනු ලබන ළමුන් සහ වින්දිතභාවයට පත්වන කාන්තාවන් වෙනුවෙන් මූලික අවශ්‍යතා සපුරා ගත හැකි අයුරින් මූලික පහසුකම් සහිතව වින්දිත තැනැත්තන්ගේ ගරුත්වය සහ පෞද්ගලිකත්වය ආරක්ෂා වන පරිදි ස්වාධීන පිවිසුමක් සහිතව කාර්යාල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. එම ව්‍යාපෘතියේ දෙවන අදියර වශයෙන් මුරුක්කන්, ධර්මපුරම්, මෝදර, කළුතර දකුණ, වලපනේ, උප්පුවෙලි, ඕපනායක යන පොලිස් ස්ථානවල ආදර්ශ ළමා හා කාන්තා කාර්යාංශය ඉදි කිරීම් අවසන් කර ළමා හා කාන්තා කාර්යාංශය වෙත භාර දී ඇත.

එමෙන්ම ඉහත ආදර්ශ ළමා හා කාන්තා කාර්යාංශ සඳහා අනුයුක්ත කර ඇති නිලධාරීන් විසින් වින්දිතයන්ට හිතකර පරිසරයක් නිර්මාණය කරමින් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව උපදේශනාත්මක මාර්ගෝපදේශ මාලාවක් එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ දායකත්වය තුළ සකස් කරන ලදි.

- **අපරාධ නිවාරණය සඳහා විධිමත් යාන්ත්‍රණයක් සකස් කිරීම...**

සැකකරුවන් පිළිබඳ තොරතුරු ලද සැනින් ඔවුන් සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු (Live Loccation) ලබා ගැනීමට සැලකිය යුතු කාලයක් ගත වන බැවින් හා එම තොරතුරු කඩිනමින් ලබා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට හා අපරාධ, ත්‍රස්තවාදය, මත්ද්‍රව්‍ය උවදුර තුරන් කර නීතිය සහ සාමය ආරක්ෂා කිරීමට පියවර ගෙන ඇත. එසේම නීත්‍යානුකූල පුරවැසියන්ගේ අනන්‍යතාවය තහවුරු කරන රටක් නිර්මාණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටි. එම ක්‍රියාවලිය තව දුරටත් කඩිනම් කිරීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් ආගමන විගමන දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පොලීසිය ඒකාබද්ධ වූ දුරකථන වාර්තා හා ග්‍රාහක සජීවී දත්ත හා බැංකු වාර්තා කඩිනමින් ලබා ගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශය සකස් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

2.1. මහජන දුක්නවිලි කඩිනමින් සමනය කිරීම පිණිස...

- **අමාත්‍යාංශයේ මහජන පැමිණිලි විසඳීම...**

අමාත්‍යාංශ සම්බන්ධීකරණ කොට්ඨාසය යටතේ පවත්වාගෙන යනු ලබන මහජන පැමිණිලි අංශය මඟින් 118 ජාතික සේවා මැදිරිය වෙත සිදු කරන ලද පොලිස් නිලධාරීන්ගේ විෂමාචාර ක්‍රියා සම්බන්ධව, පොලිස් නිලධාරින්ට විරුද්ධව මහජනයා විසින් කරනු ලබන පැමිණිලි හා පොලිස් ස්ථානය වෙත කර ඇති විභාග නොවූ පැමිණිලි සම්බන්ධව පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමන්ලා වෙත යොමු කර කඩිනම් විමර්ශනයන් සිදු කර ප්‍රගතිය ලබා ගැනිමට කටයුතු කරනු ලබයි.

තවද, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පොලීසිය, ආගමන විගමන දෙපාර්තමේන්තුව, අන්තරයාකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය යන ආයතනවලට විරුද්ධව ලැබෙන පැමිණිලි විමර්ශනය සඳහා අදාළ අංශ වෙත යොමු කරනු ලබයි. ඒ යටතේ සමාලෝචිත කාලය තුළ ශ්‍රී ලංකා පොලීසියට විරුද්ධව පැමිණිලි 6,932 ලැබී ඇති අතර එම පැමිණිලි සියල්ල සඳහා ක්‍රියාමාර්ග ගැනීමට හැකි වී ඇත.

- **118 හදිසි ඇමතුම් සේවාව...**

118 ජාතික සේවා මැදිරියේ මූලික පරමාර්ථය වී ඇත්තේ රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් මහජනයා විසින් දන්නා තොරතුරු කඩිනමින් අමාත්‍යාංශය වෙත ලබා ගැනීමය. මීට අමතරව ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ හා අමාත්‍යාංශය යටතේ ඇති සියලුම රාජ්‍ය ආයතනවලට විරුද්ධව පැමිණෙන චෝදනා හා අදහස් යොමු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියා කරයි. තවද, මේ වන විට 118 මැදිරිය ප්‍රතිසංස්කරණ කරමින් https://118.pubsec.gov.lk දරන වෙබ් අඩවිය මඟින් ශ්‍රී ලංකා පොලිස් පැමිණිලි කළමණාකරණ පද්ධතිය ස්ථාපිත කර පැය 24 පුරා ක්‍රියාත්මක වන පරිදි පිහිටුවා ඇත.

එසේම, පරිගණක ජාලය හා මෘදුකාංග පද්ධතිය (Call Center System and ELV Solution for 118) ස්ථාපිත කර පවත්වාගෙන යනු ලබන අතර, එමඟින් මහජනතාව විසින් යොමු කරන පැමිණිලි මෘදුකාංග පද්ධතියක් මඟින් ලබා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා කරයි. 118 පැමිණිලි කළමණාකරණ පද්ධතිය මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ අමාත්‍යාංශ පරිශ්‍රයේ ක්‍රියාත්මකව පවතී. එම සේවාව වෙත 2025 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට විවිධ වර්ගයේ පැමිණිලි 105,450 ලැබී ඇති අතර එම පැමිණිලි විසඳුම් ලබා දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

2.2. සංවර්ධන වැඩසටහන් අධීක්ෂණය කරමින්...

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සඳහා වාර්ෂික ප්‍රාග්ධන ප්‍රතිපාදනවලට අදාළව ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය කාර්තුමය ලෙස සමාලෝචනය කිරීමේ රැස්වීම් පවත්වන ලදි. විශේෂයෙන්ම ඉදිකිරීම් හා භාණ්ඩ මිලදී ගැනීම් ව්‍යාපෘතිවල ගැටළු ඇති වූ අවස්ථාවලදී අදාළ පාර්ශවයන් කැඳවා එම ගැටළු නිරාකරණයට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. එසේම කොන්ත්‍රාත්කරුවන්ගේ අකාර්යක්ෂමතාවය මත අඩාල වූ ව්‍යාපෘතිවල ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකා සිදු කර අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා පියවර ගෙන ඇත.

- **අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන සැලසුම් ක්‍රියාවට නංවමින්....**
  - අභ්‍යන්තර විගණන අංශය මගින් අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල විගණන විමසුම්, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය ඇතුළු අනෙකුත් මූල්‍ය හා පරිපාලන කටයුතු අදාළ චක්‍රලේඛ හා නීති රීති අනුව ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය විගණන ක්‍රියාමාර්ග ගෙන ඇත. සකස් කළ විගණන සැලැස්මට අනුව 2025 වර්ෂයේ සමාලෝචිත කාලය සඳහා අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇත. ඒ අනුව 2025 වර්ෂයට අදාළව සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම ආවරණය කිරීමට හැකි වී ඇත.
  - ආයතනික අභ්‍යන්තර ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක ආයතන තුළ අභ්‍යන්තර විගණන අංශය මගින්, ගෙවීම් වවුචර්, වත්කම් කළමනාකරණය, ගබඩා පරීක්ෂාව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ, භාණ්ඩ අපහරණ, පුද්ගලික ලිපි ගොනු නඩත්තුව, නිවාඩු සහ වාහන නඩත්තුව, අමාත්‍යාංශ වෙබ් අඩවිය යන ක්ෂේත්‍ර ඔස්සේ අදාළ කාලය තුළ විගණනයන් සිදුකර එක් එක් අංශ සඳහා අභ්‍යන්තර විගණන විමසුම් වාර්තා 35 ක් යොමු කර ඇත.

2.3. අන්තර් සහයෝගීතාවය ලබා ගනිමින්...

වර්තමාන මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු ගරු අමාත්‍යතුමා එම ධූරය භාරගැනීමෙන් පසු ප්‍රථමයෙන්ම ඒ හා බැඳුණු භාරධූර වගකීම හා කාර්යය භාර්යය ඉටු කිරීම සඳහා විවිධ පාර්ශවයන්ගේ සහයෝගය ලබා ගැනීම වෙනුවෙන් සාකච්ඡා පවත්වන ලදි. ඒ අතර විදේශ නියෝජිතයින් හා අන්තර් සම්බන්ධීකරණයන් අවශ්‍ය අමාත්‍යාංශවල අමාත්‍යවරුන් සමඟ ද සාකච්ඡා පවත්වන ලදි. එමෙන්ම අන්තර් ජාතික සහායන් ලබා ගැනීම සඳහා අවබෝධතා ගිවිසුම්වලට එළඹීම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම හා ගිවිසුම් අත්සන් තැබීමට අදාළ කටයුතු ක්‍රියාත්මක කර ඇත.

- කාන්තාවන්ට හා ළමයින්ට එරෙහිව සිදු වන හිංසනයන් වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ ශ්‍රී ලංකාවේ නියෝජිත Kunle Adeniyi ඇතුළු නියෝජිතයින් පිරිසක් ගරු මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා අතර හමුවක් පැවැත්වීය. එමෙන්ම එම රැස්වීමේදී මෙරට වත්මන් ආර්ථික, සමාජ තත්ත්වය පිළිබඳව සාකච්ඡා කළ අතර ආර්ථිකය යතාවත් කර ගැනීම සඳහා ලබා දිය හැකි විසඳුම් සම්බන්ධයෙන් ද වැඩිදුරටත් අදහස් හුවමාරු කර ගන්නා ලදි.

- ද්විපාර්ශික සබඳතා ශක්තිමත් කර ගැනීම සඳහා හා වර්තමාන රජයේ ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන පිළිබඳව, දූෂණ වංචා පිටුදැකීම පිළිබඳව ද ශ්‍රී ලංකා ජපාන තානාපති අකියෝ ඉසොමටා මහතා සහ ගරු මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා අතර හමුවේ දී අදහස් හුවමාරු කර ගන්නා ලදි.

- ශ්‍රී ලංකාවේ ඊශ්‍රායල් තානාපති රුවන් ජේවියර් අසාර් මහතා හා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය ආනන්ද විජේපාල මහතා අතර හමුවක් මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේදී සිදු විය. එහිදී දෙරට අතර ඇති සබඳතා ශක්තිමත් කර ගැනීම පිළිබඳව සාකච්ඡා කරන ලදි. එමෙන්ම තානාපතිවරයා ජාත්‍යන්තර කටයුතුවලදී ද ශ්‍රී ලංකාව සමඟ සහයෝගයෙන් වැඩකිරීමට ඊශ්‍රායල් රජය කැමැත්තෙන් සිටින බව ද දන්වා ඇත. මෙරට වත්මන් ආර්ථික, සමාජ තත්ත්වය පිළිබඳව සාකච්ඡා කළ අතර ආර්ථිකය යතාවත් කර ගැනීම සඳහා ලබා දිය හැකි විසඳුම් සම්බන්ධයෙන් ද වැඩිදුරටත් අදහස් හුවමාරු කර ගන්නා ලදි.

2.4. අමාත්‍යාංශයේ මධ්‍යකාලීන ඉලක්ක 2025 - 2027

- පොලිස් නිලධාරින්ගේ උසස්වීම්, ස්ථානමාරුවීම් සහ විනය සම්බන්ධ ගැටලු සඳහා විසඳුම් ලබාදීම කාර්යක්ෂම කිරීම හා අවශ්‍ය මානව සම්පත ලබාදීම.

- රිය අනතුරු අවම කරලීම සඳහා ශ්‍රී ලංකා පොලීසියේ රථවාහන කොට්ඨාසය නව තාක්ෂණයෙන් ශක්තිමත් කිරීමට පියවරගැනීම.

- අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව විදේශ ගමන් බලපත්‍ර සකස් කිරීම, වීසා හා පුරවැසිභාවය නිකුත් කිරීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සවිබලගැන්වීම.

- මත්ද්‍රව්‍ය උවදුර සහ අන්තරායකර ඖෂධ දුර්භාවිතය මැඩලීමට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සවිබලගැන්වීම.

- රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය ශක්තිමත් ආයතනයක් බවට පත්කර ඒ තුලින් ජාතික ආර්ථීක සංවර්ධනයට ඉහළ දායකත්වයක් ලබාගැනීම.

03. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තත්‍ය 2025 රු.	තත්‍ය 2,024 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		16,477,270,000	13,692,548,000	ඒසීඒ-3
-	තැන්පතු		124,709,666	66,289,329	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		78,230,154	73,359,626	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**16,680,209,820**	**13,832,196,955**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**16,680,209,820**	**13,832,196,955**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		252,637,935	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**16,427,571,885**	**13,832,196,955**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	ඒසීඒ-2(ii)
10,678,752,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	10,441,397,599	10,841,366,258	ඒසීඒ-2(ii)
5,434,823,500	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	4,888,177,846	2,449,010,299	ඒසීඒ-2(ii)
784,950,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	553,311,047	477,500,170	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	**8**	-	-	ඒසීඒ-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	18,440	ඒසීඒ-2(ii)
16,898,525,500	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**15,882,886,492**	**13,767,895,167**	
	මූලධන වියදම්				
738,976,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	459,634,298	289,569,977	ඒසීඒ-2(ii)
1,036,460,289	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	598,630,297	226,373,134	ඒසීඒ-2(ii)
254,383,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	203,953,494	164,094,797	ඒසීඒ-2(ii)
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	ඒසීඒ-2(ii)
13,400,000	හැකියා වර්ධනය	**14**	12,840,236	4,733,968	ඒසීඒ-2(ii)
750,000,000	වෙනත් මූලධන වියදම්	**15**	213,461,966	1,148,260,476	ඒසීඒ-2(ii)
2,793,219,289	**මුළු මූලධන වියදම් (උ)**		**1,488,520,290**	**1,833,032,353**	
	තැන්පතු ගෙවීම්		111,708,662	89,810,225	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		136,943,662	87,219,923	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**248,652,324**	**177,030,148**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**17,620,059,106**	**15,777,957,668**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(1,192,487,222)**	**(1,945,760,713)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		**(1,192,503,622)**	**(1,946,125,690)**	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		**16,400**	**364,977**	ඒසීඒ-3
			(1,192,487,222)	**(1,945,760,713)**	

3.1. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	10,745,354,371	9,727,552,943
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	107,831,692	49,121,933
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**10,853,186,063**	**9,776,674,877**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		69,103,809	24,701,051
දේපළ පිරියත හා උපකරණ සංචිතය		10,745,354,371	9,727,552,943
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	38,711,482	24,055,905
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	16,400	364,977
මුළු වගකීම්		**10,853,186,063**	**9,776,674,877**

3.2. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

		ඒසීඒ-සී
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය		
	තථ්‍ය 2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,296,100,428	991,807,572
අග්‍රිම ලැබීම්	16,477,270,000	13,692,548,000
අත්තිකාරම් අයකර ගැනීම්	73,009,432	82,328,789
තැන්පතු ලැබීම්	124,709,666	66,289,329
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**17,971,089,525**	**14,832,973,690**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	15,237,559,367	13,111,882,978
සහනාධාර සහ මාරුකිරීම්	120,842,248	89,376,874
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	785,856,321	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	772,653,409	859,582,774
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	253,002,912	-
අත්තිකාරම් ගෙවීම්	125,778,573	87,889,469
තැන්පතු ගෙවීම්	111,708,662	89,810,225
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**17,407,401,492**	**14,238,542,319**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**563,688,033**	**594,431,370**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	564,036,610	594,066,394
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**564,036,610**	**594,066,394**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(564,036,610)**	**(594,066,394)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(348,577)**	**364,977**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**(348,577)**	**364,977**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**364,977**	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**16,400**	**364,977**

3.3. මූල්‍ය ප්‍රකාශ සටහන

පිටු අංක 10 සිට 11 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 13 සිට 14 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2026 . 02 . 27
ඩී.ඩබ්.ආර්.බී. සෙනෙවිරත්න
ලේකම්
මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
18 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/~~ප්‍රධාන ගණකාධිකාරී/~~
~~අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)~~
නම :
දිනය : 27/02/2026
බී.කේ.එම්.ජේ. රුද්‍රිගෝ
මූල්‍ය නිලධාරි
මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල

2

3.4. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.'000

ආදායම් වර්ගය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසන් ආදාම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාල නොවේ					

3.5. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.'000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන - 2025		තත්‍ය වියදම 2025.12.31	උපයෝගි කර ගනු ලැබු ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	17,100,000,000.00	16,898,525,500.00	15,882,886,492.00	94%
ප්‍රාග්ධන	2,545,000,000.00	2,793,219,289.00	1,488,520,290.00	53%

3.6. මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.'000

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරිම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	-	2,092,008,550		
9152	යන්ත්‍රෝපකරණ	-	4,501,095,158		
9153	ඉඩම්	-	3,314,009,650		
9154	අස්පෘශ්‍ය වත්කම්	-	939,333		
9160	කෙරීගෙන යන වැඩ	-	837,301,681		

04. පරිච්ඡේදය - කාර්ය සාධක දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධක දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
අපරාධ විසඳීමේ ප්‍රතිශතය		✓	
විශේෂ කාර්ය බලකාය දායක්වය සැපයූ වැටලීම් ගණන	✓		
ක්‍රියාකාරී මහජන ආරක්ෂක කමිටු හා ක්‍රියාත්මක කළ දැනුවත් කිරීම් වැඩසටහන් ගණන			✓
එක්දින සේවය යටතේ දිනක් තුළ ගමන් බලපත්‍ර සකස් කිරීමට ලැබුනු අයදුම්පත් සංඛ්‍යාවට අනුව දිනක් තුළ නිකුත් කළ ගමන් බලපත්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතය	✓		

05. පරිච්ඡේදය

5.1. තිරසර සංවර්ධන අරමුණු

2030 වර්ෂය වන විට රාජකාරි මඟින් සපුරා ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක							
තිරසර සංවර්ධන අරමුණු	අදාළ වන තිරසර සංවර්ධන ඉලක්කය	තිරසර සංවර්ධන දර්ශකය	2030 වසර වන විට අපේක්ෂිත ඉලක්කය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය			වෙනත්
				0%-49%	50% - 74%	75% - 00%	
03. නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම	3.6.2030 වන විට මහාමාර්ගවල සිදු වන අනතුරු හේතුවෙන් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යා	3.6.1. පසුගිය මාස 12ක කාල සීමාව තුළ මාර්ග අනතුරු හේතුවෙන් සිදු වන මරණ සංඛ්‍යාව (අනුපාතය)	2030 වර්ෂය වන විට පාදක වර්ෂයෙන් (2015) 20% ක් අඩු කිරීම"	√			
08. සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	8.7. බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුළත් ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලුම	8.7.1 අවුරුදු 5-17 අතර ළමා ශ්‍රමිකයින් ලෙස යොදා ගෙන ඇති සංඛ්‍යාව ස්ත්‍රී පුර්ෂ සහ වයස අනුව (2023 වර්ෂය සඳහා ළමුන් දෙදෙනෙකු පිළිබඳ දත්ත වාර්තා වී ඇත.)		√			

	ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම.						
11. නගර සහ මිනිස් ජනාවාස ඇතුළත් ආරක්ෂිත ඔරොත්තු දෙන සහ තිරසර කිරීම	.11.7 2030වන විට විශේෂයෙන්ම කාන්තාවන්ට සහ ළමුන්ට, වයස්ගත පුද්ගලයින්ට සහ ආබාධ සහිත පුද්ගලයින්ට ආරක්ෂාකාරී වන, සියලු දෙනාට ම එක්ව සලකන සහ පහසුවෙන් පිවිසිය හැකි පොදු හරිත අවකාශයන් ලබා දීම	11.7.2. පෙර මාස 12 තුළ ලිංගිකත්වය, වයස, ආබාධිත තත්ත්වය සහ සිදු වූ ස්ථානය අනුව ශාරීරික හෝ ලිංගික හිරිහැරවලට ගොදුරු වූවන්ගේ අනුපාතය	මේ පිළිබඳ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් සිදු කරන සමීක්ෂණයකින් වර්තමාන ස්වභාව හඳුනා ගැනීමෙන් අනතුරු ඉලක්ක නිර්ණය කළ හැක.				ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
16. තිරසර සංවර්දනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සැම මට්ටමක ම ඵලදායී, වග වීම් සහිත පරිපූරණ ආයතන ගොඩනැගීම	16.1 සියලු ම ස්ථානයෙන් හි සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයෙන් සහ ඒ ආශ්‍රිත මරණ කැපී පෙනෙන ලෙස අඩු කිරීම.	16.1.1. පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති රටේ ජනගහනයෙන් පුද්ගලයන් 100000කට චේතනාන්විත මනුෂ්‍ය ඝාතන සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ භාවය හා වයස අනු	2030 වර්ෂය වන විට පාදක වර්ෂයෙන් (2015) 33%කින් අඩු කිරීම 100000 කය 1.5 දක්වා අඩු කිරීම				
		16.1.2 ජනගහනයෙන් පුද්ගලයන් 100000කට වාර්තා වී ඇති ගැටුම් හා සම්බන්ධ හේතු නිසා සිදු වන මරණ සංඛ්‍යාව, (ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ හේතුව අනුව	2030 වර්ෂය වන විට මරණ සංඛ්‍යාව 0 බවට පත් කිරීම (100%ක්)				
		16.1.3 පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති කායික, මානසික හෝ ලිංගික හිංසනයට ගොදුරු වූ වින්දිතයන්ගේ සංඛ්‍යාව, ශ්‍රී ලංකාවේ ජනගහනයට අනුපාතය	2030 වර්ෂය වන විට පාදක වර්ෂයෙන් (2015) 45% කින් අඩු කිරීම ජනගහන 100,000 18කි.				
		16.1.4 අඳුර වැටීමෙන් පසුව තමන් ජීවත් වන ප්‍රදේශයේ වටා තනිව ම ඇවිදීම ආරක්ෂිත යැයි හැඟෙන සංඛ්‍යාව, ශ්‍රී ලංකාවේ ජනගහනයට අනුපාතය	මේ පිළිබඳ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් සිදු කරන සමීක්ෂණයකින් අනතුරුව වර්තමාන ස්වභාව හඳුනා ගැනීමෙන් අනතුරුව මෙහි ඉලක්කය නිර්ණය කළ හැක.				ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

	16.2 ළමුන් කෲර වධහිංසා කිරීම්වලට සහ අපයෝජනයට, සූරාකෑමට, කුට්ටනයට සහ සියලු ම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ට ලක් වීම අවසන් කිරීම	16.2.1 පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති භාරකරුවන්/රැකවලුන් /මෙහෙකරුවන් අතින් කායික දඬුවම් හෝ මානසික ප්‍රචණ්ඩත්වය අත්විඳීමට සිදු වූ වයස අවු 1-17 දක්වා වන ළමුන්ගේ සංඛ්‍යාව (ආසන්න දර්ශකය : ළමුන්ට එරෙහිව සිදු කරන අපරාධ සංඛ්‍යාව	2030 වර්ෂය වන විට පදනම් වර්ෂයෙන්(2015) 25% අඩු කිරීම	√			
		16.2.2 පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති ජනගහනයේ පුද්ගලයන් 100000ක් අතරින් මිනිස් ජාවාරමෙහි ගොදුරු බවට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ භාවය හා වයස සහ අපයෝජනයේ ස්වරූපය අනුව	2030 වර්ෂය වන විට මිනිස් ජාවාරම්වලට ගොදුරු වන්නන් සංඛ්‍යාව 0 කිරීම (100%)	√			
		16.2.3 පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති වයස අවු 18 වන විට ලිංගික හිංසනය අත්විඳ ඇති වයස අවු 18-29 වයස් කාණ්ඩයේ තරුණ කාන්තාවන් සහ පිරිමින්ගේ සංඛ්‍යාව ජනගහනයට අනුපාතය	මේ පිළිබඳ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් සමීක්ෂණයක් සිදු කිරීමෙන් මෙහි වර්තමාන තත්වය ඇගයීමකට ලක් කර අනතුරුව ඉලක්ක අගය නිර්ණය කළ හැකි ය.				ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
	16.3 සියලු ම දෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකි වීම සහ ජාතික සහ අන්තර්ජාතික මටට්මින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම	16.3.3 ශ්‍රී ලංකා පොලිසියට වාර්තා වන පැමිණිලි සංඛ්‍යාව (ආසන්න දිර්ශකයකි)	ශ්‍රී ලංකා පොලිසිය මඟින් පරිපාලන දත්ත ලබා දීම පමණක් සිදු කරන අතර මෙම දර්ශකයෙහි අගය අධිකරණ අමාත්‍යාංශය ලබා දේ.				වගකීම අදිකරණ අමාත්‍යාංශය සතු වන අතර පරිපාලන දත්ත ශ්‍රී ලංකා පොලිසිය මඟින් ලබා දේ.
	16.4 2030 වන විට නීති විරෝධී මූල්‍ය සහ ආයුධ ප්‍රවාහයන් කැපී පෙනෙන ලෙස අඩු කිරීම, සොරකම් කරන ලද වත්කම් නැවත ලබා ගැනීම ශක්තිමත් කිරීම	16.4.1 අභ්‍යන්තර සහ බාහිර නීති විරෝධී මූල්‍ය ප්‍රවාහවල මුළු වටිනාකම) වත්මන් එක්සත් ජනපද ඩොලර් වලින්	ශ්‍රී ලංකා පොලිසියෙන් මෙතෙක් දත්ත ලබා දී නොමැති අතර මෙම දර්ශකය සඳහා ඉලක්ක අගයන් ලබා දීම සම්බන්ධයෙන් මහ				මහ බැංකුව හා ආදායම් බදු දෙපාර්තමේන්තුව අගයන් සකස් කිරීම ප්‍රායෝගික නොවේ.

	සහ සියලුම ආකාරයේ සංවිධානාත්මක අපරාධ තුරන් කිරීම		බැංකුව හා ආදායම් බදු දෙපාර්තමේන්තුව එක්ව සිදු කළ යුතු කළ යුතු ව ඇත				
		16.4.2 පසුගිය මාස 12ක කාලය තුළ වාර්තා වී ඇති ජාත්‍යන්තර ප්‍රමිතිය / ක්‍රියාදාමයට අනුකූලව නිසි බලධාරියෙකු විසින් නීති විරෝධී සම්භවය හෝ පසුබිම සොයා ගැනීම හෝ ස්ථාපිත කර ඇති අත් අඩංගුවට ගත්, සොයා ගත් හෝ භාර දුන් ආයුධවලට අදාළ සිද්ධි සංඛ්‍යාව හා එයට අදාළ ආයුධ සංඛ්‍යාව	2030සඳහා අපේක්ෂිත අගයන් සකස් කර නොමැත තත්කාලයේ දිවයින තුළ තිබෙන නීති විරෝධි අවි පිළිබඳ ප්‍රායෝගිකව දැන ගැනීමට නොහැක				(තත්කාලයේ දිවයින තුළ තිබෙන නීති විරෝධි අවි පිළිබඳ ප්‍රායෝගිකව දැන ගැනීමට නොහැකිය)
	16.10 ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තිත්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම තහවුරු කිරීම	16.10.1 පසුගිය මාස 12 තුළ වාර්තා වී ඇති මාධ්‍යවේදීන්, මාධ්‍යවේදි ආශ්‍රිතයන්, වෘත්තීය සමිති සාමාජිකයින් සහ මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින්නන් ඝාතනය කිරීම, පැහැර ගෙන යාම, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම, අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම සහ වධහිංසා පැමිණ වීම් පිළිබඳ සත්‍යාපිත සිද්ධීන් සංඛ්‍යාව	2030 වර්ෂය වන විට 0 දක්වා අඩු කර ගැනීම (%100)				මෙම ඉලක්කයට අදාළව මාධ්‍යවේදීන් සම්බන්ධව පමණක් සංඛ්‍යා දත්ත පමණක් ගණනය කර ඇත.
		.16.10.1a. ලිංගිකත්වය වයස් කාණ්ඩය අනුව අපයෝජනය වන ආකාරය හෝ අපයෝජන අපරාධකරුවන්ගේ ස්වභාවය	ළමාරක්ෂක අධිකාරිය මඟින් ප්‍රධාන වශයෙන් දත්ත ලබා දීම සිදු ව ඇත. මේ සඳහා ඉලක්ක අගය ළමාරක්ෂක අධිකාරිය නිර්ණය කල යුතුව ඇත.				ළමාරක්ෂක අධිකාරිය

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකවින් විස්තර කරන්න.

1) මාර්ග අනතුරුවලින් සිදුවන මරණ සංඛ්‍යාව අඩුකිරීම මෙම අමාත්‍යාංශයට අදාළවන තිරසර සංවර්ධන ඉලක්කයකි. ශ්‍රී ලංකාවේ මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන මරණ අනුපාතය පසුගිය වසර කීහිපය හා සැසඳීමේදී සමාන මට්ටමක පවතින බව දැක ගත හැකිය. මාර්ග අනතුරුවලින් සිදු වන ජීවිත හානි අඩු කිරීමට ක්‍රියා මාර්ග ගැනීමේදී පාලනය කිරීමට අපහසු ප්‍රධාන සාධක ලෙස හඳුනා ගත හැක්කේ වාහන ප්‍රමාණයට ප්‍රමාණවත් වන ලෙස මාර්ග පද්ධතිය ගුණාත්මකව පුළුල් නොවීම හා රියදුරන් විනයගරුක ලෙස කටයුතු නොකිරීමය. මෙම හේතු සාධක සඳහා පිළියම් යෙදීමට අදාළ සියලු පාර්ශව සමඟ ඒකාබද්ධ ප්‍රවේශයකින් වැඩසටහන් ක්‍රියාත්මක කල යුතු වන අතර එය අභියෝගයක් ලෙස හැඳින්විය හැකිය.

2) සමාජය තුළ ජීවත් වන පුද්ගලයින්ගේ අපේක්ෂිත සිතුම් පැතුම් ඉටු කර ගැනීමට නොහැකි සමාජ, ආර්ථික හා සංස්කෘතික තත්ත්වයක් ගොඩනැගී පැවතීම, සියදිවි නසාගැනීම් සිදුවීමට බලපාන ප්‍රධාන සාධකය වේ. සියදිවි නසා ගැනීම් අඩු කරලීම සඳහා සමස්ත රාජ්‍ය යාන්ත්‍රණය එම අයහපත් තත්ත්වයන් සමනය කිරීමට ඒකාබද්ධව කටයුතු කළ යුතු වේ. එය අභියෝගයක් ලෙස හැඳින්විය හැකිය.

3) අමාත්‍යාංශය යටතේ හඳුනාගෙන ඇති තිරසර සංවර්ධන දර්ශකවල අගයන් 2030 වන විට යහපත් තත්ත්වයකට පත්වීමට උපරිමයෙන් ක්‍රියාමාර්ග ගනිමින් සිටී. අපේක්ෂිත අගයන්වලට ළඟා වීමට පවත්නා නීති සංශෝධනය කිරීමටත්, නව නීති සම්පාදනය කිරීම හා ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන ආයතනවල සහය ලබා ගනිමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී. අපරාධ සිදුවීමට පාදක වන පසුබිම වෙනස් කිරීමට අදාළව ක්‍රියා මාර්ග ගැනීමට සියලු ආයතන එක් විය යුතු අතර එක් ආයතනයකට පමණක් එය කළ නොහැකිය.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	22	15	07
තෘතියික	05	01	04
ද්විතීයික	70	55	15
ප්‍රාථමික	35	25	10
තාවකාලික	05	02	03

තෘතියික මට්ටමේ තනතුරු වන සිංහල දෙමළ භාෂා පරිවර්තක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී, සංඛ්‍යාලේඛන නිලධාරී යන තනතුරු සඳහා නිලධාරීන් මෙතෙක් බඳවා ගැනීමට හෝ අනුයුක්ත කර ගැනීමට නොහැකි වීම මත අමාත්‍යාංශයේ ඇතැම් රාජකාරි කටයුතු සිදු කිරීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවී ඇත.

- ආයතනික කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිගය හෝ අතිරික්තය බලපාන්නේ කෙසේදැයි කෙටියෙන්.

  ආයතනික විෂය පථය විශ්ලේෂණයට ලක්කර 2025 වර්ෂයේ අනුමත කර ගත් සේවක සංඛ්‍යාවෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ (මාණ්ඩලික නිලධාරින්ගේ) ඇබෑර්තු ප්‍රමාණය සම්පූර්ණ කිරීමට නොහැකි වීම තුළ ආයතනයේ අධීක්ෂණය කරනු ලබන රාජකාරී සඳහා ඍජුව බලපෑම් කරයි. සෙසු මට්ටම්වල නිලධාරින්ගේ හිඟය දෛනික ආයතනික කටයුතුවල කාර්යසාධනය කෙරෙහි බලපෑමක් ඇති කරනු ලබයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්ඕ/එච්/එම්පීඑස්/එස්ආර්/2025/02 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2026 මැයි 21 දින

ලේකම්
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

ශීර්ෂය 189 - මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ශීර්ෂය 189 - මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත්කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා

දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම්

වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය (ඒසීඒ - 2 (i)) අනුව ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ ප්‍රාග්ධන වියදම්වල එකතුව රු.55,696,115ක් වූ අතර, ජාතික පොලිස් අභ්‍යාස ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශ අනුව දරන ලද ප්‍රාග්ධන වියදම රු.55,135,361ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව ජාතික පොලිස් අභ්‍යාස ආයතනය වෙනුවෙන් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ දරා ඇති වියදම්වල එකතුවෙහි රු.560,754ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

විශේෂ කාර්යය බලකායේ මරදාන සහ රාජගිරිය කඳවුරු සඳහා අනුයුක්ත කර තිබූ රු.175,000ක් වටිනා නිලසුනඛයින් 05දෙනෙකු සම්බන්ධයෙන් සහ විශේෂ කාර්ය බලකායේ කඳවුරුවල ඇති ගස්වල වටිනාකම තක්සේරුකර ජීවවිද්‍යාත්මක වත්කම් ලෙස (Other Non-Financial – Biological Assets) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ)	නිවාඩු ලේඛන (පොදු 190)	ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 ඡේදය	යාවත්කාලීන කර නොතිබුණි.
(ආ)	හානි පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 110	යාවත්කාලීන කර නොතිබුණි.
(ඇ)	බැරකම් පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 214	පවත්වා නොතිබුණි.

3

(ඇ)	ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 891	යාවත්කාලීන කර නොතිබුණි.
(ඉ)	ලොග් සටහන් පොත්	මුදල් රෙගුලාසි 1645	යාවත්කාලීන කර නොතිබුණි.
(ඊ)	මෝටර් වාහන ලැයිස්තුව	මුදල් රෙගුලාසි 1647 (ඉ)	පවත්වා නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) මූලික වියදම් ඇස්තමේන්තුවෙන් වැය විෂයන් 08ක් සඳහා වෙන්කර තිබූ රු.12,240,000ක සමස්ත ප්‍රතිපාදනයම අදාළ අරමුණ සඳහා වැයනොකර වෙනත් වැය විෂයයන් සඳහා මාරුකර තිබුණි.

(ආ) ඇස්තමේන්තු සකස්කිරීමේ දී වැය විෂයයන් 27ක් සඳහා මූලික වියදම් ඇස්තමේන්තුව සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර විචලතාවය මූලික ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 54 සිට සියයට 525ක් දක්වා පරාසයක් තුළ පැවතුණි.

(ඇ) වැය විෂයන් 17ක් සඳහා සලසා තිබූ එකතුව රු.2,323,743,500ක් වූ ශුද්ධ ප්‍රතිපාදිතයෙන් රු.1,528,887,871ක් ඉතිරිවී තිබුණු අතර, එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 53 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ඈ) වැය විෂයන් 18ක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකරන ලද රු.203,090,000ක ප්‍රතිපාදනයෙන් රු.42,706,225ක් ඉතිරි වී තිබුණු අතර, එම ඉතිරිය මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකිරීම්වල ප්‍රතිශතයක් ලෙස සියයට 10 සිට සියයට 115ක පරාසයක්ගෙන තිබුණි. එය තුළ වැය විෂයන් දෙකක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ ප්‍රතිපාදන මාරුනොකළ ද, වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත්ව පැවතුණි.

3.2 බැරකම් හා බැදීම්වලට එළැඹීම

(අ) 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ 3.3 ඡේදය හා මු.රෙ. 94(2) සහ 94(3) ප්‍රකාරව එළැඹෙන ලද බැදීම් හා බැරකම් වෙන වෙනම හෙළිදරව්කළ යුතු වුවත්, වැය විෂයන් 14කට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසානයට එළැඹී තිබුණු රු.33,891,542ක් බැරකම් හා බැදීම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

4

(ආ) මු.රෙ. 94(1) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් ඉක්මවා වියදමකට හෝ බැඳීමකට නොබැඳී සිටිය යුතු වුව ද, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපාදන ඉක්මවා වැය විෂයන් 4ක් යටතේ රු.17,918,131ක් බැඳීම් හා බැරකම් ලෙස එළැඹ තිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

3.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**	
(i) II පරිච්ඡේදයේ 4.1, 4.2 සහ 13.1 (ආ) ඡේද	2020 ජූලි 01 දින සිට සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා වර්ෂ 05 මාස 06කට වැඩි කාලයක් තුළ අවස්ථා 05ක දී වැඩබැලීමේ අනුමැතිය සඳහා ප්‍රමාදවී ඉල්ලුම්කර අවුරුදු 02 මාස 05කට වැඩි කාලයක් පූර්ව අනුමැතියකින් තොරව පරිපාලන නිලධාරී තනතුරේ වැඩබැලීම සිදුකර තිබූ අතර, වැඩබැලීමේ දීමනා ලෙස රු.642,805ක් ගෙවා තිබුණි.
(ii) XII පරිච්ඡේදයේ 1.2 ඡේදය	අමාත්‍යාංශයේ නිලධාරීන් 16දෙනෙකුට අදාළව පෞද්ගලික නිවාඩු, රාජකාරි නිවාඩු හෝ බැහැරයාම් ලෙස හඳුනාගත නොහැකි අනුමැතියකින් තොරව ලබාගත් නිවාඩු 166ක් විය.
(iii) XII වැනි පරිච්ඡේදයේ 3.1 ඡේදය	අමාත්‍යාංශයේ බැහැරයාමේ ලේඛනය සහ පැමිණීම හා පිටවීම සම්බන්ධ ලොග් වාර්තා පරීක්ෂා කිරීමේ දී නිලධාරීන් 11කට අදාළව බැහැරයාමේ ලේඛනයේ ඇතුළත්ව නොමැති අනුමැතියකින් තොර බැහැරයාම් 114ක් විය.

5

(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

(i) මුදල් රෙගුලාසි 103 (1) (ආ)

හොරකම්, හදිසි අනතුරු යනාදිය වැනි නැතිවීම්/ හානිවීම් සම්බන්ධයෙන් වූ විට පොලීසියට වාර්තා කළ යුතු වුවත්, ඩ්‍රෝන යානා අනතුරු 05ක් සහ වාහන අනතුරක් සම්බන්ධයෙන් පොලීසියට වාර්තාකර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 104 (4)

නැතිවීම්/ හානිවීම් සම්බන්ධයෙන් අලාභය සිදුවූ දිනයේ සිට තුන්මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත්කළ යුතු වුවත්, අමාත්‍යාංශයේ වාහන අනතුරු 2කට අදාළ වාර්තා ඉදිරිපත්කර නොතිබුණු අතර, අනතුරු 05කට අදාළව පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මාස 03 සිට මාස 13 දක්වා පරාසයක පැවති අතර, විශේෂ කාර්ය බලකායේ ඩ්‍රෝන යානා 3ක් සහ ගෝනහේන කඳවුරෙහි සීසීටීවී කැමරා පද්ධතිය හා දූරකථන පද්ධතියට සිදුවූ අලාභය සම්බන්ධයෙන් පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මාස 3 සිට වර්ෂ 2 දක්වා පරාසයක පැවතුණි.

(iii)මුදල් රෙගුලාසි 156 (ආ)

රජය විසින් තමා වෙත නිකුත්කරන ලද හෝ තමා භාරයේ තබාගැනීමට දෙන ලද්දා වූ දේපළක් සුරක්ෂිතව තබාගැනීම, නිසිපරිදි පාවිච්චි කිරීම සම්බන්ධ සියලුම අවස්ථාවල වගකිව යුතු වේ. එසේ වුව ද, වාහන අනතුරු 7ක් සම්බන්ධයෙන් නීතිමය කටයුතු අවශ්‍ය නොවන බව රියදුරු විසින් පොලීසිය වෙත පැමිණිලිකර තිබුණි.

(iv)මුදල් රෙගුලාසි 880,881

ඇප තැබිය යුතු රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැබිය යුතු වන අතර, ඇප තැබිය යුතු නිලධාරියෙකු එකී තනතුරට පත්කළ දිනයේ සිට හෝ එවැනි තනතුරකට මාරුකළ දිනයේ සිට දෙමසක් ඇතුළත ඇප තැබීම කළ යුතු වුවත්, අමාත්‍යාංශයේ නිලධාරීන් 22දෙනෙකුගෙන් ඇපමුදල් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 26 දිනැති අංක 08/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදය

විශේෂ කාර්ය බලකාය සතු රථවාහන 1473න් රථවාහන 851ක් එනම් සියයට 58ක් රක්ෂණය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

(i) 4.2 ඡේදය

වාහනවල බාහිර අලුත්වැඩියාවන් සඳහා ප්‍රසම්පාදන හෝ මිලගණන් කැඳවීම තුළින් ආයතනයක් තෝරාගත යුතු වුව ද, 2023 සිට 2025 වර්ෂය දක්වා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

		සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව වාහන 05ක් අවස්ථා 07ක දී අලුත්වැඩියා කර රු.461,700ක් ගෙවීම්කර තිබුණි.
	(ii) 4.3 ඡේදය	වාහනවල අභ්‍යන්තර අලුත්වැඩියාවක දී වාහනය ගරාජයක් වෙත ගෙනගොස් කොටස්වලට ගලවා ගරාජය විසින් ඉදිරිපත් කරන මිලගණන්වල සාධාරණත්වය සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ මණ්ඩලයක සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබාගෙන අලුත්වැඩියාවක් කළ යුතු වුවත්, වාහන ගැලවීමකින් තොරව, අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතන වෙතින් මිලගණන් කැඳවා පිරිවිතරයකින් හෝ තොරව වාහන 08ක් අවස්ථා 14ක දී අලුත්වැඩියා කර රු.2,785,286ක් ගෙවීම් කර තිබුණි.
(ඉ)	2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4 ඡේදය	සියලුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මඟින් රාජ්‍ය නිලධරයන් කාර්යාලයට පැමිණීම සහ පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වූ වාර්තා තබාගත යුතු බව දක්වා තිබුණ ද, විශේෂ කාර්ය බලකායේ නිලඇඳුම් කාර්ය මණ්ඩල නිලධාරීන් හැර අනෙකුත් කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතාකර නොතිබුණි.
(ඊ)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	
	(i) 3.4.2 ඡේදය	සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි සැපයුම්කරුවන් 16දෙනාගෙන් 5දෙනෙකුගේ වාහනවල අංකය සඳහන් කරමින් විද්‍යුත් තැපැල මඟින් මිලගණන් කැඳවා තිබුණි.
	(ii) 3.4.2 (ආ) ඡේදය	ප්‍රසම්පාදන කමිටුවල හා තාක්‍ෂණික ඇගයීම් කමිටුවල අනුමැතිය ලබාගැනීමට කටයුතුකර නොතිබුණු අතර, අතිරේක ලේකම්ගේ අනුමැතිය මත වාහන සේවා කිරීම සඳහා ආයතනයක් තෝරාගෙන රු.1,187,380ක් ගෙවීම් කර තිබුණි.
(උ)	2024 ප්‍රසම්පාදන අත්පොත 3.1.5 ඡේදය	මූලික කොන්දේසි පැහැදිලිව දක්වනු ලබන මිල ගණන් කැඳවීම් නිකුත්කිරීමෙන් පසු මුද්‍රා තබන ලද මිල ගණන් ලබාගත යුතු වන අතර ආරක්ෂිත /මුරපද මඟින් ආරක්ෂිත ඉලෙක්ට්‍රෝනිකව ඉදිරිපත් කරන මිල ගණන්වලට ද ඉඩ සැලසිය හැකි වේ. එසේ වුව ද, අමාත්‍යාංශයේ රු.1,333,781ක ප්‍රසම්පාදනයන් 7ක් සම්බන්ධයෙන් මිලගණන් කැඳවීමේ දී ඉදිරිපත් කරන ලද විද්‍යුත් තැපැල වෙත මිලගණන් යොමු කරන ලෙස ආයතනය වෙත දැනුම් දී තිබුණු අතර, එසේ තිබියදී ලංසු විවෘත කිරීමේ කමිටුවක් ද පත්කර තිබුණි.

7

3.5 තැන්පතු

(අ) මු.රෙ. 571(1) ප්‍රකාරව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ඉකුත් වූ සියලු තැන්පතු පිළිබඳ ලැයිස්තුවක් පිළියෙලකළ යුතු වුව ද, විශේෂ කාර්ය බලකාය විසින් ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයේ සහ විශේෂ කාර්ය බලකායට අයත් පොදු තැන්පතු ගිණුම් 4ක අවුරුදු 2-5ත් අතර කාලයකට අදාළ රු.1,395,900ක තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571(2) ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) 2016 මැයි 11 දිනැති අංක අමප/16/0738/703/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික ප්‍රවාහන බලඇණියක් මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කිරීමට හා ඒ සඳහා අවශ්‍ය අවිආයුධ, සන්නද්ධ රථ, ප්‍රවර්ථන වාහන, සන්නිවේදන උපකරණ ඇතුළු අනෙකුත් උපකරණ මිලදීගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු අතර, සාමසාධක රාජකාරී සඳහා නිලධාරීන් යෙදවීම තුළින් විදේශ විනිමය උපයාගැනීම, නිලධාරීන්ගේ නිපුණතා සංවර්ධනය, ජාත්‍යන්තර වශයෙන් අත්දැකීම් ලබාගැනීම, නිලධාරීන්ගේ ආර්ථික තත්ත්වය ශක්තිමත්කර ජීවන තත්ත්වය ඉහළ නැංවීම වැනි කරුණු අරමුණු කරගෙන ව්‍යාපෘතිය ආරම්භකර තිබුණි. එසේම 2017 අගෝස්තු 30 දිනැති අංක අමප/17/1811/748/001-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රු. මිලියන 1175.64ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ සිට 2023 දක්වා රු.1,872,800,823ක වියදම් දරා තිබුණු අතර, 2024 සැප්තැම්බර් 14 දිනැති අංක අමප/24/1788/626/023 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට පියවරගන්නා ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත නියම කිරීමට තීරණයකර තිබුණි. තව ද, 2024 සැප්තැම්බර් 06 දිනැති අංක MF/NB/CM/222/2024/189/06 දරන මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය තුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සටහනට අනුව 2024 සැප්තැම්බර් 06 දින වන විට රු.මිලියන 2,000කට ආසන්න වියදමක් දරා ඇති මෙම ව්‍යාපෘතිය තුළින් රජයට නිසිප්‍රතිලාභයක් අත්වී නොතිබුණි.

(ආ) සාමසාධක පොලිස් බලමුළුව එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා පිටත් කිරීමට අවශ්‍ය අවසන් පරීක්ෂණය වන Assessment of operational Capability (AOC) හා Verification Visit (VV), Rapid Deployment Level – (RDL) මට්ටම සම්පූර්ණකර නොතිබුණු අතර, ඒ සඳහා 2025 ජූනි 23 හා 2025 ජූනි 30 යන දිනයන්හී පවත්වා ඇතත්, මෙම වාර්තාවේ දින තෙක් එක්සත් ජාතීන්ගේ සාමාසාධක පොලිස් රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් යෙදවීම අවස්ථාව ලැබී නොතිබුණි.

(ඇ) සාමසාධක රාජකාරී සඳහා අවශ්‍ය වාහන ඇතුළු අනෙකුත් උපාංග මිලදීගැනීම සඳහා රු.මිලියන 2,191ක් වැයකර තිබුණු අතර, ව්‍යාපෘතිය වෙනුවෙන් මිලදීගන්නා ලද රු.1,264,019,078ක් වටිනා වාහන 53ක් 2018 වර්ෂයේ සිට විගණිත දිනය දක්වා කඳවුරු තුළ ගාල්කර තිබුණි. එම වාහන නඩත්තු කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා දරා ඇති වියදම රු.5,393,617ක් විය.

4.2 ප්‍රසම්පාදනයන්

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අයත් Nissan Teana රථය මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය අයිතිය පවරාගැනීමකින් තොරව වෙන්දේසි කිරීම සඳහා යොමුකර තිබුණි. එහි දී තක්සේරු වටිනාකම වන රු.7,000,000ට සාපේක්ෂව සියයට 18කට වඩා වැඩි ඉහළ මිලක් ඉදිරිපත් වී තිබූ නමුත් රථයේ අයිතිය පවරාගෙන නොතිබීම හේතුවෙන් අපහරණය කිරීමට නොහැකිවී තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

(අ) විශේෂ කාර්ය බලකායේ ගෝනහේන පසු මූලස්ථාන කඳවුරෙහි ප්‍රවාහන අමතර කොටස් ගබඩාවෙහි රථවාහන මාදිළි 7ට අවශ්‍ය වර්ග 698කට අයත් තොග අයිතම 6,856ක තොග, වර්ෂ 10කට අධික කාලයක් භාවිතයකින් තොරව ගබඩාකර තිබුණි.

(ආ) විශේෂ කාර්ය බලකායේ කඳවුරු සියල්ල ආවරණය වන පරිදි සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියට අදාළව ලබාගත් ආදර්ශකයන් 61ක් ප්‍රසම්පාදන කටයුතු අවසන්ව වර්ෂ 8කට අධික කාලයක් අදාළ ප්‍රසම්පාදනය සිදුකළ ආයතනයට නැවත භාරදීමෙන් තොරව බලකායේ ප්‍රවර්ථන අංශයෙහි ආදර්ශ ගබඩාව තුළ තැන්පත්කර තිබුණි.

(ඇ) විශේෂ කාර්ය බලකායේ ප්‍රවර්තන අංශයට අයත් පොදු ගබඩාවෙහි 2022 වර්ෂයේ පොලිස් මධ්‍යම අවිගබඩාව මඟින් ලබාදුන් 2006 හා 2007 වර්ෂයන්හි දී නිෂ්පාදිත නමුත් ලබාදෙන අවස්ථාවේ දී ද කල් ඉකුත්වී පැවති භාවිතයට නුසුදුසු බවට නිර්දේශ වූ පපු ආවරණ සහ කෙවුල (Body Armor) 248ක් අපහරණයකින් තොරව වර්ෂ තුනකට අධික කාලයක් ගබඩාකර තිබුණි.

(ඈ) විශේෂ කාර්ය බලකායේ ප්‍රවර්ථන අංශයට අයත් පොදු ගබඩාවෙහි භාණ්ඩ වර්ග 6කට අයත් තොග අයිතම 6,116ක් වර්ෂ 10කට ආසන්න කාලයක් භාවිතයට ගැනීමකින් තොරව ගබඩාකර තිබුණි.

(ඉ) විශේෂ කාර්ය බලකායේ ප්‍රවර්ථන අංශයට අයත් උණ්ඩ ගබඩාව තුළ 2025 අගෝස්තු කල් ඉකුත්වූ අපහරණයකර නොමැති Grenade (3PCS)-N 500 වර්ගයේ කඳුළු වායු අත්බෝම්බ 468ක් තිබුණි.

(ඊ) 1998 වර්ෂයේ සිට 2008 දක්වාවූ කාලපරාසය තුළ එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් අත්අඩංගුවට ගෙන භාවිතයට ගත හැකි තත්ත්වයේ නොපවතින නමුත් මේ දක්වා අබලිකර නොමැති T-56 I Rifle තුනක් සහ T-56 II Rifle 34ක් විශේෂ කාර්ය බලකා ප්‍රවර්ථන අවිගබඩාව තුළ පැවතුණි.

(උ) විශේෂ කාර්ය බලකායේ ඩ්‍රෝන යානා අනතුරු සම්බන්ධ පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2022 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා විශේෂ කාර්ය බලකායේ ඩ්‍රෝන යානා 05ක් අනතුරට ලක්වී තිබූ අතර, ඉන් එක් යානයක් පමණක් අලුත්වැඩියාකර නැවත බාර දී තිබුණි. වගකීම් කාලය තුළ අනතුරට ලක්වූ මෙම යානය භාවිත තත්ත්වයට පත්කිරීම සඳහා වර්ෂ 03කට ආසන්න කාලයක් ගතකර තිබුණි.

(ii) 2021 වර්ෂයේ රු.5,800,000කට මිලදීගන්නා ලද ඩ්‍රෝන යානා 2ක් වගකීම් කාලය තුළ, එනම් 2022 වර්ෂයේ අනතුරට ලක්වී තිබුණු අතර, මෙතෙක් අලුත්වැඩියාකර

9

නොතිබුණි. ඒ අනුව මෙම යානා 2ක වර්ෂ තුනකට වැඩි කාලයක් භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

(iii) 2021 වර්ෂයේ රු.5,800,000කට මිලදීගන්නා ලද ඩ්‍රෝන යානා 2ක් 2024 වර්ෂයේ දී අනතුරට ලක්වී අනතුරට ලක්වී තිබුණු අතර, එම යානා අලුත්වැඩියා කිරීම සඳහා මිලදීගත් ආයතනය වෙත රු.1,305,655ක් ගෙවා ඇතත්, මෙතෙක් අලුත්වැඩියාව අවසන්කර නොතිබුණි.

(iv) අන්තර් ජාතික තොරතුරු විශ්ලේෂණ අනුව බහුපියාපත් සහිත ඩ්‍රෝන යානා අතරින් සියයට 70ක් අනතුරට ලක්වන බව අනතුරු පිළිබඳ පර්යේෂණ මණ්ඩල වාර්තාවල දක්වා තිබූ නමුත්, අනතුරට ලක්වූ ඩ්‍රෝන යානා රක්ෂණය කර නොතිබුණි.

4.4 පාඩු හා හානි

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට මු.රෙ. 109 ප්‍රකාරව කටයුතු නොකරන ලද රු.48,172,062ක වටිනාකමක් සහිත කපාහොහළ හානිවීම් පැවැති අතර, ඒ තුළ වර්ෂ 10 ඉක්මවූ වාහන අනතුරු 02කට අදාළ කපාහොහළ රු.1,580,977ක ශේෂයක් ද, වර්ෂ 05ත් 10ත් අතර වාහන අනතුරු 05කට අදාළ රු.3,565,536ක ශේෂයක් පැවතුණි. තව ද වර්ෂ 02ත් 05ත් අතර වාහන අනතුරු 16කට අදාළ රු.14,695,260ක ශේෂයක් හා වෙනත් හානිවීම්වලට අදාළ රු.17,041,061ක් ලෙස එකතුව රු. 31,736,321ක ශේෂයක් පැවතුණි.

(ආ) පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි (ඇමුණුම ii) වර්ෂය තුළ පොතෙන් කපා හැරීම් ලෙස වාහන අනතුරු ඇතුළු වෙනත් හානිවීම් 27කට අදාළ රු.8,940,906ක මුදලක් කපාහැරීම් ලෙස දක්වා තිබුණ ද, ඉන් විශේෂ කාර්ය බලකායේ වාහනයකට අදාළව රු.2,190,183ක් විධිමත් අනුමැතියකින් තොරව කපාහැර තිබුණි.

(ඇ) විශේෂ කාර්ය බලකායේ ගෝනහේන කඳවුරෙහි සිසිටීවී කැමරා පද්ධතියට සහ දුරකථන පද්ධතියට අකුණුසැර වැදීම නිසා සිදුවූ අලාභය තක්සේරු කිරීමේ දී නියෝජිත ආයතන මගින් ලබාදුන් ඇස්තමේන්තුවක් භාවිතාකිරීම නිසා 2024 මූල්‍ය ප්‍රකාශවල මෙම අලාභය මු.රෙ. 109 පොතෙන් කපාහැරීම් ලේඛනයෙහි, පොතෙන් කපාහැරීමක් ලෙස රු.1,055,520ක් වැඩියෙන් දක්වා තිබුණි.

4.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබානොදීම

2025 නොවැම්බර් සිට වාර්තාවේ දින තෙක් මෙතෙක් නිකුත්කර ඇති විගණන විමසුම් 03කට පිළිතුරු ලබා දී නොතිබුණි.

4.6 කළමනාකරණ දුර්වලතා

(අ) නිලධාරීන් මියයාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම, සේවය හැරයාම සහ අනෙකුත් හේතු මත දැනට අමාත්‍යාංශයේ සේවයේ නොමැති නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට අයවිය යුතු වර්ෂ 1 සිට 10ට වඩා වැඩි ණයශේෂ එකතුව රු.315,372ක් විය.

(ආ) වාහන දෙකක් අනතුරට ලක්වීම සම්බන්ධයෙන් ලද රු.59,974ක රක්ෂණ ප්‍රතිලාභය අමාත්‍යාංශයේ මැදිහත්වීමකින් තොරව අදාළ රක්ෂණ ආයතනය විසින් සෘජුවම වාහන අලුත්වැඩියා කරන ලද ගරාජ වෙත ගෙවා තිබුණි.

10

(ඈ) රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

(i) 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන පනතේ 9 (ඈ) වගන්තිය ප්‍රකාරව සෑම අවුරුද්දකටම යටත් පිරිසෙයින් එක්වරක්වත් නියමිත ආකාරයට රාජ්‍ය නොවන සංවිධානයේ ගිණුම් විගණනය කිරීමට සැලැස්විය යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී මට්ටමේ පවතින රාජ්‍ය නොවන සංවිධාන 649න් විගණනය කරන ලද මූල්‍ය වාර්තා (2024) ඉදිරිපත්කර ඇත්තේ සංවිධාන 144ක් පමණි. මීට අමතරව රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයට වාර්ෂිකව ලබාදිය යුතු ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තා, වාර්ෂික වාර්තා හා වත්කම් වාර්තා යාවත්කාලීනව ලබාදීම ඉතා අඩු මට්ටමක පැවතුණි. 2016 අංක 06 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනත ප්‍රකාරව ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන ලෙස ලියාපදිංචිය ලබා සක්‍රීය මට්ටමේ පවතින ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන 22න් මාසික ද්‍රවශීල වත්කම් අනුපාතය සම්බන්ධ වාර්තා සහ ණය පහසුකම් පිළිබඳ ත්‍රෛමාසික වාර්තා, කාර්තුමය මූල්‍ය තත්ත්ව ප්‍රකාශ සහ විස්තීරණ ආදායම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම ඉතා අඩුමට්ටමක පැවතුණු අතර, කිසිදු ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත්කර නොතිබුණි.

(ii) විදේශ ප්‍රභවයන්ගෙන් අරමුදල් නොලබන, සමාගම් පනත යටතේ ලියාපදිංචි කර නොමැති, ලියාපදිංචි කරනු ලබන අවස්ථාවේ කිසිදු දිස්ත්‍රික්කයක ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් නොපැවති ජාතික මට්ටමේ රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ලියාපදිංචි කිරීමට තරම් ධාරිතාවය වර්ධනය නොවූ ආයතනයක් අංක එල්-193304 දරන ලියාපදිංචි අංකය යටතේ ජාතික මට්ටමේ රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස 2024 ජූලි 19 දින ලියාපදිංචි කර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයට අදාළව ජාතික මට්ටමේ රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයට ලැබී තිබුණු පැමිණිලිවලින් නොවිසඳී ඇති පැමිණිලි සංඛ්‍යාව 2කි. දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් ලැබී තිබුණු පැමිණිලි අතරින් නොවිසඳී ඇති පැමිණිලි 6ක් විය.

(iv) අවම මිලගණන් යටතේ රෝහල් පහසුකම් සැළසීම අරමුණු කරගත් 2024 පෙබරවාරි 28 දින රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ලියාපදිංචිය ලබා ඇති රෝහල් භාරයක් විසින් වෙළඳපොළ තරඟකාරී ඉහළ මිලගණන් අයකරමින් රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස සුඛෝපභෝගී පෞද්ගලික රෝහලක් සිය වත්කම් වර්ධනය කරගනිමින් පවත්වාගෙන යනු ලබයි. මෙම ආයතනය ලියාපදිංචි දින සිට සමාලෝචිත වර්ෂයේ අවසානයට විගණිත මූල්‍ය ප්‍රකාශ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයට ඉදිරිපත්කර නොතිබුණි. තව ද, මූල්‍ය ප්‍රකාශ පිළියෙලකිරීම සම්බන්ධ ලේඛන හා පොත්පත් පරීක්ෂාව සඳහා සිදුකළ ස්ථානීය පරීක්ෂාවේ දී ද එම ලේඛන පොත්පත් රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීමට ආයතනය කටයුතුකර නොතිබුණි.

(v) 1980 අංක 31 දරන ස්වේච්ඡා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීමේ) පනත සහ 1998 අංක 08 දරන ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීමේ (සංශෝධිත) පනත මඟින් රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය සහ අධීක්ෂණය සම්බන්ධයෙන් ප්‍රමාණවත් විධිවිධාන සලසා නොමැති බැවින් රාජ්‍ය නොවන සංවිධාන සිය අරමුණුවලින් බැහැරවීම්, අරමුදල් අවභාවිතා කිරීම හෝ වංචාවන්ට යොමුවීමේ අවධානමක් පැවතුණි.

11

5. මානව සම්පත් කළමනාකරණය

(අ) දින 48ක කාලයකට වැටුප් සහිත විශේෂ නිවාඩු ලබා විදේශගත වූ අමාත්‍යාංශ කළමනාකරණ සේවා නිලධාරියෙකු ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 23:10:1 ඡේදය ප්‍රකාරව විදේශ නිවාඩු දීර්ඝකර ගැනීමට ඉල්ලීමක් සිදුකිරීමකින් තොරව වර්ෂයකට අධික කාලයක් විදේශගතව සිට ඇත. ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 23:16 ඡේදය ප්‍රකාරව නැවත දිවයිනට පැමිණීමෙන් පසුව පෞද්ගලිකව පෙනී සිටීමෙන් හෝ ලිපියකින් හෝ අමාත්‍යාංශ ලේකම් දැනුවත් කිරීමක් සිදුකළ යුතු වුවත්, දිවයිනට පැමිණ වර්ෂයකට අධික කාලයක් සේවයට වාර්තා කිරීමට හෝ ඒ බව දැනුවත් කිරීමට කටයුතුකර නොතිබුණි. නිලධාරියා විදේශ නිවාඩු අවසන්ව සේවයට වාර්තාකළ යුතු දින සිට වර්ෂ 02 මාස 06ක් ගතවන තෙක් අමාත්‍යාංශය විසින් සේවය හැරයාමේ නිවේදනය නිකුත්කිරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 2023 සිට 2025 දක්වා කාලපරාසය තුළ විශේෂ කාර්ය බලකායේ භටයන් සංඛ්‍යාවේ අඩුවීම 1,070ක් වූ අතර, සේවය අතහැරයාම් සහ බලකායෙන් පිටතට ස්ථාන මාරුවීම් හේතුවෙන් භටයන් සංඛ්‍යාවේ අඩුවීම 771ක් විය.

(ඇ) 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් සඳහා ලබාදෙන විශේෂ අවි හා උපක්‍රම පාඨමාලාව (Special weapon and Tactics- SWOT) හදාරා බලකායෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා පිටව ගිය නිලධාරීන් සංඛ්‍යාව 24කි.

(ඈ) අනිවාර්යය සේවා කාලය සම්පූර්ණ කිරීමට පෙර සේවයෙන් ඉල්ලා අස්වන විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගෙන් වන්දි ලෙස අයකර ගනු ලබන මුදල 1983 මාර්තු 02 දිනැති අංක 234 දරන ශ්‍රී ලංකා පොලිස් ගැසට්පත්‍රයේ දක්වා ඇති අතර, එක් එක් තනතුරට බඳවාගන්නා ආධුනික නිලධාරීන්ගෙන් සේවය හැරයාමක දී අයකරගන්නා ප්‍රතිශෝධිත වන්දි ප්‍රමාණය රු.5,000 සිට රු.12,234ක පරාසයක් තුළ පැවතුණි. නමුත් මේ වන විට ආධුනික නිලධාරීන් හට මූලික පුහුණුව සඳහා බලකාය විසින් දරන ලබන පිරිවැය රු.222,215 සිට රු.881,928ක පරාසක් තුළ පැවතිය ද, ආධුනික නිලධාරීන් අනිවාර්ය සේවා කාලය අවසන්වීමට පෙර සේවයෙන් ඉවත්වන්නේ නම් අයකර ගනු ලබන වන්දි මුදල සත්‍ය වශයෙන් මූලික පුහුණුව සඳහා දරන ලබන පිරිවැයට සාපේක්ෂව අවම මට්ටමක පැවතුණි.

කේ. කේ. එස්. ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව,සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරනය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරන චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම. මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල නොවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3	2007.09.20 දිනැති MSD චක්‍රලේඛ 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ		
17.	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18.	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත			

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධක ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		